වාර්ෂික වාර්තාව සහ ගිණුම්
வருடாந்த அறிக்கையும் கணக்கும்
ANNUAL REPORT AND ACCOUNTS

2016

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
உள்ளூர் கடன்கள் மற்றும் அபிவிருத்தி நிதியம்
LOCAL LOANS AND DEVELOPMENT FUND

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிஅமைச்சு

Ministry of Internal & Home Affairs and Provincial Councils & Local Government

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2016

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දැක්ම

පළාත් පාලන බලප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම මගින් මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම.

මෙහෙවර

ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සපයනු ලබන තිරසාර සහ ස්වාධීන මූල්‍ය ආයතනයක් බවට පත්වීම.

පටුන

පිටුව

1. කොමසාරිස් මණ්ඩලය 05
2. දර්ශනය, මෙහෙවර, අරමුදල්, සංස්ථාපනය, අරමුණු 06
3. ආයතනික තොරතුරු 07
4. පාලන ක්‍රියාවලිය 08
5. මෙහෙයුම් හා මූල්‍ය විග්‍රහය 11
6. ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති 24
7. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 26

මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

8. විගණකාධිපති වාර්තාව 28
9. විස්තීරණ ආදායම් ප්‍රකාශනය 41
10. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය 42
11. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 44
12. ගිණුම්කරණ සටහන් 45
13. ගිණුම්කරණ ප්‍රතිපත්ති 53

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
කොමසාරිස් මණ්ඩලය

(2016.12.31 දිනට)

සභාපති

01. එච්.ටී.කමල් පත්මසිරි මහතා - ලේකම්, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

භාණ්ඩාගාර නියෝජනය

02. ඩබ්.එම්.එම්.බී.එච්.ගුණරත්න මහතා - අධ්‍යක්ෂ, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

සාමාජිකයින්

03	ජේ.එම්.ආර්.පී.ජයසිංහ මහතා	පළාත් පාලන කොමසාරිස්	(වයඹ පළාත)
04	එම්.එස්.ප්‍රේමවංශ මහතා	ප්‍රධාන ලේකම්	(මධ්‍යම පළාත)
05	කේ.ඒ.තිලකරත්න මහතා	ප්‍රධාන ලේකම්	(උතුරු මැද පළාත)
06	එස්.ජේ.එම්.එච්.සී.සමරකෝන් මහත්මිය	පළාත් පාලන කොමසාරිස්	(බස්නාහිර පළාත)
07	ගාමිණී රාජකරුණා මහතා	ප්‍රධාන ලේකම්	(ඌව පළාත)
08	එච්.පී.කුලරත්න මහතා	ප්‍රධාන ලේකම්	(සබරගමුව පළාත)
09	ඩී.එම්.එස්.අබේගුණවර්ධන මහතා	ප්‍රධාන ලේකම්	(නැගෙනහිර පළාත)
10	ඒ.පතිනාතන් මහතා	ප්‍රධාන ලේකම්	(උතුරු පළාත)
11	ආර්.සී.ද සොයිසා මහතා	ප්‍රධාන ලේකම්	(දකුණු පළාත)
12	පී.රූපසිංහ මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	
13	එස්.ඒ.අබේසිංහ මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	

වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2016

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

දැක්ම

පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම මගින් මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම.

මෙහෙවර

ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික පහසුකම් සැපයීමට අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සපයනු ලබන තිරසාර සහ ස්වාධීන ආයතනයක් බවට පත්වීම.

අරමුණ

නීතියෙන් බලය ලැබී ඇති පරිදි පළාත් පාලන ආයතන වලට මහජන උපයෝගීතා සේවා පවත්වාගෙන යාම සඳහා සහනදායී පොළියකට මූල්‍ය පහසුකම් සැපයීම සහ අනුබල ලබාදීම.

අරමුදල්

ණය දීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොළී ප්‍රතිශතයක් මත මධ්‍යම රජයේ වාර්ෂික අයවැයෙන් දීර්ඝ කාලීන ණය මුදලක් වශයෙන් නිකුත් කරනු ලැබේ. ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) සහ 2201 SRI (SF) සඳහා වන චක්‍රීය අරමුදල් ද ණය නිකුත් කිරීම සඳහා උපයෝගී වී ඇත. 2009 වර්ෂයේදී රු.මි.25 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන ඇති අතර ඉන් පසු කිසිඳු අරමුදලක් ලබාගෙන නොමැත.

ආයතනික තොරතුරු

සංස්ථාපනය

1916 අංක 22 දරණ ආඥා පනත යටතේ ආරම්භ කරන ලදුව, 1930 අංක 06, 1931 අංක 25, 1938 අංක 43, 1942 අංක 21 දරණ ආඥා පනත්, සහ 1949 අංක 29 දරණ පනත, 1974 අංක 09 දරණ නීතිය සහ 1993 අංක 24 දරණ පනත යන පනත් වලින් සංශෝධිත දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2010 වර්ෂයේ සිට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අතර නැවත 2016 වර්ෂයේදී පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය විය.

කාර්යභාරය

ශ්‍රී ලංකාව තුල මහ නගර සභා 24, නගර සභා 41 සහ ප්‍රාදේශීය සභා 276 ලෙස සංස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 341 ක් සඳහා ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී පදනමක් මත සැපයීම මූලික කාර්යභාරය වේ.

ලියාපදිංචි ස්ථානය	**නො.** 24/A, **වෝඩ් පෙදෙස,** **කොළඹ** 07
දුරකථනය	011-2687514
ෆැක්ස්	011-2691261
විද්‍යුත් තැපැල්	lldf1916@gmail.com

කොමසාරිස් මණ්ඩලයේ සංයුතිය

1993 අංක 24 දරණ දේශීය ණය සහ සංවර්ධන (සංශෝධිත) පනතේ අංක 2 ප්‍රකාර කොමසාරිස් මණ්ඩලය ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන අවම වශයෙන් සාමාජිකයින් 13 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(අ) සභාපති - පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්
(ආ) මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් අයෙකු
(ඇ) එක් එක් පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් 09 දෙනෙකු
(ඈ) ගරු අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙකු.

විගණකවරු: විගණකාධිපති දෙපාර්තමේන්තුව
අභ්‍යන්තර විගණනය: අභ්‍යන්තර විගණන අංශය - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
බැංකු කරුවෝ: ලංකා බැංකුව

කාර්ය මණ්ඩලය

2016 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

ප්‍රධාන විධායක නිලධාරී	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්)	01
සහකාර ගණකාධිකාරී	01
පරිපාලන නිලධාරී	01
සංවර්ධන නිලධාරී	17
කළමනාකරණ සහකාර	08
රියදුරු	02
කාර්යාල කාර්ය සහායක	02
එකතුව	**33**

පාලන ක්‍රියාවලිය

ආයතනයේ පාලන ක්‍රියාවළිය කොමසාරිස් මණ්ඩලය මගින් ක්‍රියාත්මක වන සංයුක්ත ක්‍රියාවලියක් වශයෙන් හැඳින්විය හැකිය. පාලන ක්‍රමයක වැදගත්ම අංගය වන මෙය ආයතනයේ ඒකාබද්ධ සාර්ථකත්වය සහ අඛණ්ඩ ආර්ථිකමය පැවත්මට ඉවහල් වේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය,ඒකාබද්ධ පාලන ක්‍රියාවලිය පවත්වා ගැනීම මගින් ව්‍යාපාරික ආචාර ධර්ම, පාරදෘශ්‍යතාවය සහ ඉහළ වගකීම් තත්වයන් පවත්වාගැනීම සඳහා බැඳී ඇත.

කොමසාරිස් මණ්ඩලය

සංයුතිය

කොමසාරිස් මණ්ඩලය සභාපති ඇතුළු දාහතර දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ විශේෂිත දැණුම සහ පළපුරුද්ද ආයතනයේ ව්‍යාපාරික ක්‍රියාවලියට උපකාරී වේ.කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් කිසිවකු ආයතනය සමග ගනුදෙනු වලට සම්බන්ධවී නැති අතර එය ඔවුන්ගේ කාර්යයන් ඉටුකිරීමේදී ස්වාධීනත්වය පවත්වාගෙන යාමට ඉවහල් වී ඇත.

තීරණ ගැනීම

කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් මසකට වරක් රැස්වන අතර එහිදී එදිනෙදා කටයුතු ද විමර්ෂනයට භාජනය කරන අතරම සුවිශේෂ වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ද ගනු ලැබේ. තවද කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් විසින් ආයතනික අරමුණු ලඟාකර ගැනීමට අදාළ වන උපාය මාර්ගද තීරණය කරනු ඇත.

වගකීම

1. ආයතනික ශක්තිය, කාර්‍යක්ෂමතාව සහ අවදානම සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර උපාය මාර්ග සැකසීම.
2. ඉහත උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.
3. පවතින ක්‍රමවේදයේ ක්‍රියාකාරීත්වයට අදාළව අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, ආචාරධර්ම, පවතින නීති සහ ව්‍යවස්ථාවලට අනුකූලතාවය දක්වන බවට වගබලාගැනීම.
4. ප්‍රාග්ධන වියදම් නිරීක්ෂණ සහ අභිමන්ත්‍රණය හා සමාලෝචනය.
5. ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වයේ කාර්‍යසාධනය අධීක්ෂණය.
6. තොරතුරු ක්‍රමවේදය සහ විගණන ක්‍රියාවලිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම.

ස්වාධීන විනිශ්චය

කොමසාරිස් මණ්ඩලයේ ක්‍රියාකාරකම් වලදී සෑම කොමසාරිස්වරයෙකුම තම ස්වාධීන මතය ප්‍රකාශ කළ යුතු අතර, අනෙක් පාර්ශව වල අයුතු බලපෑම් වලට හෝ අගති ගාමී බලපෑම් වලට යටත් නොවිය යුතුය. උපායමාර්ග පිළිබඳ තීරණ ගැනීම, උපාය මාර්ග ක්‍රියාවට නැංවීම, කාර්‍යසාධන සමාලෝචනය සම්පත් බෙදාහැරීම සහ ව්‍යාපාරික ආචාරධර්ම පවත්වාගෙන යාම ආදී කටයුතු සඳහා කොමසාරිස් වරුන්ගේ අවධානය යොමු වේ.

සභාපති

සභාපතිගේ කාර්යභාරය පැහැදිළිව විස්තර කර වෙන්කර දක්වා ඇති අතර එමගින් ආයතන රාමුව තුල එනිසා බල තුලනයක් නිර්මාණය වී ඇත. පුද්ගලයන්ගේ තනි කැමැත්ත අනුව තීරණ ගැනීමේ ස්වභාවය සීමාවී ඇත.

සභාපතිගේ කාර්යභාරය

සභාපතිගේ නායකත්වය යටතේ කොමසාරිස් මණ්ඩලය නියමිත උපායමාර්ග වෙත මගපෙන්වීම සහිතව වෘත්තීමය ස්වභාවයෙන් කටයුතු කිරීමට සලස්වා ඇත. කොමසාරිස් මණ්ඩලය වෘත්තීමය ආකාරයෙන් මෙහෙයවීම හා මග පෙන්වීම සඳහා නායකත්වය දීමට ඔහුට හැකියාව ඇත.

කොමසාරිස් මණ්ඩලය පත් කිරීම

කොමසාරිස් මණ්ඩලය පත්කිරීමේ ක්‍රියා පටිපාටිය ඉතා පැහැදිලි විනිවිද භාවයෙන් යුක්ත වන අතර එය අදාළ ආඥා පනත අනුව පැහැදිලි කර ඇත.

විගණනය සහ වගකීම

ආයතනික තත්වය සහ අනාගතය ඇගයීම

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සහිතව මෙම ආයතනයේ අනාගත දැක්මට අනුව රාජ්‍ය අංශයේ "සී" පංතියේ ආයතනයක් වශයෙන් කටයුතු කරගැනීම සඳහා ආයතනයේ කාර්යය මණ්ඩලය ප්‍රතිව්‍යූහගතකර ඇති අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන් දෙදෙනෙකු බඳවාගැනීමට කටයුතුකර ඇත.

මනා අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා අවදානම් කළමනාකරණය

කොමසාරිස් වරුන් විසින් ක්‍රියාවට නංවන ලද අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය මගින් ආයතනයේ ආයෝජන සහ වත්කම් සුරක්ෂිත භාවය තහවුරු කර ඇත. තවද අභ්‍යන්තර පාලන ක්‍රම වල පවතින ආවේණික අඩුපාඩු හේතුකොටගෙන ඇතිවන වැරදි සහ වංචා සම්බන්ධව කොමසාරිස් මණ්ඩලය දැණුවත් වී ඇත.

අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධව කලින් කල සිදුකරණ විමර්ශන

කොමසාරිස් වරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් සිදුකරන විමර්ෂණ ඇසුරින් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධ නිරීක්ෂණ පාලක මණ්ඩලයට යොමුකරන අතර පාලක මණ්ඩලය මගින් නියමිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය

පාලක මණ්ඩල කොමසාරිස්වරුන් විසින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) වලට අනුකූලව සකස්කර ඇති බවට සහතික කරන අතර මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය දැනට පවතින අදාළ නීති සහ ක්‍රියාත්මක භාවයන්ට අනුකූලව සිදු කර ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කර ඇති බවටද සහතික කරයි.

අඛණ්ඩ පැවැත්ම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල නියමිත ද්‍රවශීලතා තත්වයන් යටතේ එහි ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

ව්‍යවස්ථාපිත බැඳීම්

කොමසාරිස් වරුන් විසින් ඔවුන්ගේ දැණුම සහ විශ්වාසයට අනුව රජයට ඇති මූල්‍යමය බැඳීම් හා ව්‍යවස්ථාමය වශයෙන් සේවකයන්ට ඇති බැඳීම් සඳහා නියමිත ගෙවීම් කර ඇති බව හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල සලසා ඇති බව සම්බන්ධයෙන් සෑහීමකට පත්වේ.

අනෙකුත් පාර්ශවයන් සමග ඇති සම්බන්ධතාවය

සේවකයන්

පාලක මණ්ඩලය විසින් සම්පාදිත ආයතනයේ දැක්ම, අරමුණු සහ පරමාර්ථ සම්බන්ධව ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් වී ඇත. අවම වයස් සීමාවට අඩු කිසිම පුද්ගලයෙකුට ආයතනයේ රැකියා අවස්ථා සලසා නොමැත. ආයතනයේ රැකියා අවස්ථා සහ උසස්වීම් සඳහා ජාතිය, ලිංගභේදය ආදී වෙනස්කම් සැලකිල්ලට භාජනය නොකෙරේ.

නියාමන ආයතන

මහා භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග අර්ථවත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සම්බන්ධව පාලක මණ්ඩලය සහතික වී ඇත. ආයතනයේ පැවැත්ම සහ ක්‍රියාකාරීත්වය අදාළ ආයතන මගින් නිකුත් කරන නීති සහ නියෝග නිසි පිලිපැදීම මගින් සහ රටේ පවතින නීතිවලට අනුකූලතාව දැක්වීමෙන් සාක්ෂාත් වී ඇත.

පරිසරය

ආයතනය සහ නිලධාරීන් පිළිගත් සම්මත උපයෝගී කරගැනීම මගින් පරිසර පද්ධතිය මනා ලෙස පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් විශේෂ සැලකිල්ල යොමු කොට ඇත.

මෙහෙයුම් සහ මූල්‍ය විග්‍රහය

මෙහෙයුම් සහ මූල්‍ය විග්‍රහය

2016 වර්ෂයේ කාර්යසාධනය

2016 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මි.200 ක මුදලක් ඇස්තමේන්තු ගත කර තිබුණි. වර්ෂය තුලදී පළාත් පාලන ආයතන 09 ක් වෙත නිකුත් කළ මුළු ණය වටිනාකම රු.මි.144.6 කි. පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම ප්‍රතිශතයක් ලෙස ගත්කළ 72% කි. මෙම ණය මුදල් සහනදායී පොළී ප්‍රතිශතයක් මත වසර 5 -10 කින් ආපසු ගෙවිය යුතුවේ.

2016 වර්ෂය තුලදී ණය නිකුත් කිරීමේ සාරාංශය පහත දැක්වේ;

	ව්‍යාපෘති වර්ගය	පොළී ප්‍රතිශතය (වාර්ෂික)	මුදල (රු.)	ව්‍යාපෘති සංඛ්‍යාව
1	මාර්ග නඩත්තු ඒකක පිහිටුවීම	9.0%	34,520,000	03
2	ආදාහනාගාර ඉදිකිරීම	6.5%	5,900,000	01
3	පොදු වෙළඳපළ ඉදිකිරීම	9.0%	23,228,000	03
4	කසල කළමනාකරණ ව්‍යාපෘති	6.5%	50,000,000	01
5	මහජන පුස්තකාල ඉදිකිරීම	7.0%	31,000,000	01
	එකතුව		**144,648,000**	**09**

ආදායම

උපයාගන්නා ලද දළ ආදායම රු.මි.177 කි (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති මගින් නිකුත් කළ ණය මුදල් ද ඇතුළුව). ඊට අමතරව රාජ්‍ය බැංකුවල චක්‍රීය අරමුදල් ආයෝජනය කිරීමෙන් රු.මි.52.6 ක් ද උපයාගෙන ඇත. ආයතනයේ පරිපාලන වියදම් සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වලට ලබාදී ඇති ප්‍රදානයන් වෙන් කිරීමෙන් පසු ශුද්ධ ලාභය රු.මි.94.1 කි. (පොත්වලින් ගැලපූ ප්‍රදාන කොටස රුපියල් මිලියන 54 කි) තවද 2016 වර්ෂයේ ගණනය කරන ලද ණය හානිකරණයේ අගය රු.මි.142 කි. ඒ අනුව බදු පෙර ලාභය රු.මි.4.4 කි.

2016 වර්ෂය තුල පොළී ආදායම, ආයෝජන ආදායම සහ මහා භාණ්ඩාගාරයට පොළී ගෙවීම (ව්‍යාපෘති අනුව)

(රු.මි)

	LLDF	PCDP	UDLIHP	LGIIP	මුළු එකතුව
පොළී ආදායම	81.4	4.8	92.4	126.1	304.7
මහා භාණ්ඩාගාරයට පොළී ගෙවීම්	15.2	4.8	72.3	35.4	127.7

2016 වර්ෂය තුල ආයෝජන ආදායම් පහතින් දැක්වේ

(රු.මි)

	LLDF	UDLIHP	LGIIP	මුළු එකතුව
භාණ්ඩාගාර බිල්පත්	1.2	-	1.8	3.0
ස්ථාවර තැන්පතු පොළී	-	1.3	-	1.3
අරමුදල් කළමනාකරණ ගිණුම	1.0	0.2	0.4	1.6
REPO ආයෝජන	17.7	7.0	21.9	46.6
එකතුව	19.9	8.5	24.1	52.5

පසුගිය වර්ෂ 05 ක දළ ආදායම - 2012 - 2016

(රු.මි)

වර්ෂය	බදු ගෙවීමට පෙර දළ ලාභය (රුපියල් මිලියන)
2012	(335.4)
2013	(246.4)
2014	(134.1)
2015	5.1
2016	4.4

LLDF — දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් නිකුත් කළ ණය
PCDP — බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත් කළ ණය මුදල්
UDLIHP — නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
LGIIP — පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්

2016 වර්ෂය තුලදී දේශීය අරමුදල් සඳහා ණය වාරික සහ පොළී මුදල් වශයෙන් පිළිවෙලින් රු.මි.21.9 ක් සහ රු.මි.15.2 ක් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ රු.මි.74.1 ක් ණය වාරික වශයෙන් ද රු.මි.72.3 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.1.7 ක් ණය වාරික වශයෙන් ද රු.මි.35.4 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්යාපෘතිය වෙනුවෙන් රු.මි.3.9 ක් ණය වාරික වශයෙන් ද රු.මි.4.8 ක් පොළී වශයෙන් ද ආපසු ගෙවා ඇත.

(රු.මි)

	වාරික ගෙවීම්	පොළී ගෙවීම්	එකතුව
LLDF	21.9	15.2	37.1
PCDP	3.9	4.8	8.7
UDLIHP	74.1	72.3	146.4
LGIIP	1.7	35.4	37.1
එකතුව	101.6	127.7	229.3

ණය ආපසු අයකිරීම

වර්ෂය තුලදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ චක්‍රීය අරමුදල් වලින් ලබාදුන් ණය වලින් ණය වාරික වශයෙන් රු.මි.138 ක් ද පොළී මුදල් වශයෙන් රු.මි.75.3 ක් ද පළාත් පාලන ආයතනයන්ගෙන් ආපසු අයකරගෙන ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය තුලින් රු.මි.97.1 ක් ණය වාරික වශයෙන් ද රු.මි.70.9 ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය තුලින් රු.මි.1.8 ක් ණය වාරික වශයෙන් ද රු.මි.6.4 ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.126.9 ක් වාරික වශයෙන්ද රු.මි. 108.6 ක් පොළී වශයෙන් ද ආපසු අයකරගෙන ඇත.

(රු.මි)

	වාරික අයකිරීම්	පොළී අයකිරීම්	එකතුව
LLDF	138.0	75.3	213.3
PCDP	1.8	6.4	8.2
UDLIHP	97.1	70.9	168.0
LGIIP	126.9	108.6	235.5
එකතුව	363.8	261.2	625.0

දේශීය ණය සහ සංවර්ධන අරමුල
2016.12.31 දිනට ණය නිකුත් කිරීම

	පළාත් පාලන ආයතනය	පළාත	මුදල (රු.)	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති	ආදාහනාගාර ඉදිකිරීම	මාර්ග සංවර්ධනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	පොදු වෙළඳ සංකීර්ණ ඉදිකිරීම	මහජන පුස්තකාල ඉදිකිරීම
1	බිබිල ප්‍රා.ස	ඌව	4,539,000				4,539,000	
2	කෝට්ටේ ම.න.ස	බස්නාහිර	50,000,000	50,000,000				
3	සූරියවැව ප්‍රා.ස	දකුණු	15,600,000			15,600,000		
4	මීගමුව ම.න.ස	බස්නාහිර	31,000,000					31,000,000
5	එරාවූර්පත්තු ප්‍රා.ස	නැගෙනහිර	9,400,000			9,400,000		
6	දෙහිඕවිට ප්‍රා.ස	සබරගමුව	7,689,000				7,689,000	
7	කෝරලේපත්තු උතුර ප්‍රා.ස	නැගෙනහිර	9,520,000			9,520,000		
8	කෝට්ටේ ම.න.ස	බස්නාහිර	11,000,000				11,000,000	
9	මහියංගනය ප්‍රා.ස	ඌව	5,900,000		5,900,000			
	එකතුව		**144,648,000**	**50,000,000**	**5,900,000**	**34,520,000**	**23,228,000**	**31,000,000**

ණය නිකුත් කිරීම - පළාත් අනුව
2016 වර්ෂය

පළාත	මුදල (රු.)	ප්‍රතිශතය (%)
බස්නාහිර	92,000,000	64
දකුණු	15,600,000	11
සබරගමුව	7,689,000	05
ඌව	10,439,000	07
නැගෙනහිර	18,920,000	13
එකතුව	144,648,000	100



ණය නිකුත් කිරීම - 2016 වර්ෂය
පළාත් පාලන ආයතන වර්ගය අනුව

පළාත් පාලන ආයතන වර්ගය	මුදල (රු.)	ප්‍රතිශතය (%)
මහ නගර සභා	92,000,000	64
නගර සභා	-	-
ප්‍රාදේශීය සභා	52,648,000	36
එකතුව	144,648,000	100



දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2012 - 2016

රුපියල් මිලියන

වර්ෂය	වාරික				පොළිය				මුළු එකතුව
	LLDF	PCDP	UDLIHP	LGIIP	LLDF	PCDP	UDLIHP	LGIIP	
2012	22.9	1.26	109.6	-	21.8	7.6	90.8	29.0	283.0
2013	22.8	1.02	90.8	-	20.4	5.8	99.0	35.6	275.4
2014	22.5	3.80	90.8	-	18.6	5.2	100.0	35.0	275.9
2015	22.2	1.60	90.8	-	16.9	4.9	95.3	35.5	267.2
2016	21.9	3.90	74.1	1.7	15.2	4.8	72.3	35.4	229.3
එකතුව	112.3	11.58	456.1	1.7	92.9	28.3	457.4	170.5	1,330.80

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ (LGIIP) නිකුත්කළ ණය මුදල් සඳහා සහන කාලය තුල දී පොළිය පමණක් මහා භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවීම කරනු ලැබේ.

LLDF	දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් නිකුත් කළ ණය
PCDP	බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත් කළ ණය මුදල්
UDLIHP	නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
LGIIP	පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්
2012 – 2016
දේශීය ණය සහ සංවර්ධන අරමුදල

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2012	22.9	21.8
2013	22.8	20.4
2014	22.5	18.6
2015	22.2	16.9
2016	21.9	15.2



මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්
2012 –2016
බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP)

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2012	1.26	7.6
2013	1.02	5.8
2014	3.80	5.2
2015	1.60	4.9
2016	3.90	4.8



මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2012–2016

නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP)

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2012	109.6	90.8
2013	90.8	99.0
2014	90.8	100.0
2015	90.8	95.3
2016	74.1	72.3



මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2012–2016
පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP)

රුපියල් මිලියන

වර්ෂය	වාරික ගෙවීම්	පොළී ගෙවීම්
2012	-	29.0
2013	-	35.6
2014	-	35.0
2015	-	35.5
2016	1.7	35.4



	2012	2013	2014	2015	2016
වාරික	0.0	0	0.0	0	1.7
පොළිය	29.0	35.65	35.0	35.5	35.4

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
කාර්ය සාධනය 2012 – 2016
(ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති හැර)

වර්ෂය	නිකුත් කළ ණය	ණය වාරික අයකිරීම්	ණය පොළී අයකිරීම්
2012	76,249	115,281	51,231
2013	225,479	124,086	54,394
2014	303,392	130,626	53,694
2015	292,589	126,671	75,639
2016	144,648	138,011	75,351



ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) - (UDLIHP)
නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ඉහත ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය ආපසු අය කර ගැනීමේ ආයතනය වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදල කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන 27 ක් සඳහා නිකුත්කළ ණය වල වටිනාකම රු.මි.2,270 ක් වේ. මෙම ව්‍යාපෘති අතුරින් 70% ක ණය අයකිරීම් කරගෙන යනු ලබන අතර ඉතිරි ව්‍යාපෘති වල ණය ආපසු අයකිරීමේ ගැටළු පැන නැගී ඇත. මීට ප්‍රධාන හේතුව වශයෙන් දැක්විය හැක්කේ මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද වෙළඳ සංකීර්ණ අසාර්ථක වීමත් අනෙකුත් ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් ද විවිධ ගැටළු පැන නැගී ඇති වීමත්ය.

පසුගිය වසර 05 ක ණය අයකිරීමේ ප්‍රගතිය (UDLIHP)

(රු.මි)

වර්ෂය	ණය වාරික අයකිරීම්	පොළී අයකිරීම්
2012	76.6	93.5
2013	82.4	90.3
2014	89.6	80.0
2015	94.7	69.4
2016	97.1	70.9

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF)
පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) දරණ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකර ගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා 2006 ජනවාරි මස ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල අතර ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරන ලදී. ඉහත ව්‍යාපෘතිය යටතේ නාගරික යටිතල පහසුකම් සහ මූලික නාගරික සේවා වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීමේ කාර්යයන් ඇතුලත් වේ. ඒ යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර 05ක් හඳුනාගෙන ඇත.

1. ග්‍රාමීය ජල සම්පාදනය
2. පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග සංවර්ධනය
3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
4. නාගරික ජලාපවහන සහ මළාපවහන පද්ධතිය සංවර්ධනය
5. කුඩා පරිමාණ ප්‍රජා යටිතල පහසුකම් (මූලික සෞඛ්‍ය සායන හා පුස්තකාල ආදිය)

උක්ත ව්‍යාපෘතිය මෙහෙයවනු ලබන්නේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය මගින් වන අතර පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා වෙන් කරන ලද මුළු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 42.5 කි. මෙය 100% ක ණය මුදලක් වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අතර වසර 08ක සහන කාලයක් සමග වසර 32 කින් මහා භාණ්ඩාගාරය වෙත නැවත ගෙවිය යුතුය. සහන කාලය තුලදී පොළී අනුපාතය 1% ක් වන අතර සහන කාලයෙන් පසු 1.5% කි.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ලබාදෙන ව්‍යාපෘති සඳහා ණය සහ ප්‍රදාන වශයෙන් කොටස් 02 කි. පළාත් පාලන ආයතන වල වර්ගීකරණය අනුව ණය මුදල 33% සිට 53% දක්වා වන අතර ප්‍රදානය 40% සිට 60% දක්වා වේ. යටකී ප්‍රදානය දැරිය යුතුව ඇත්තේ ණය සඳහා වන 9% ක පොළී මුදලිනි. මේ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල ඉතා විශාල අවදානමක් දැරිය යුතුව ඇත.

උප ව්‍යාපෘති ශක්‍යතාවය පළාත් පාලන ආයතනවල ඉදිරි ආදායම් මත නිගමනය වේ. මූල්‍ය සහ පළාත් පාලන ක්‍රියාකාරී සැලැස්ම සහ හැකියා වර්ධන ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය අංග වන අතර එම අංග ක්‍රියාත්මක වීම මගින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය අයකරගැනීම සුරක්ෂිතතාවය සහතික වන අතරම ණය පැහැර හැරීමේ අවදානම අඩුවේ. ඒ අතරම ණය ආපසු ගෙවීම් නිසි පරිදි සිදුවීමට පළාත් පාලන ආයතන වල මූල්‍ය තත්වය ශක්තිමත් හා තිරසර විය යුතුය. එමෙන්ම අරමුදලෙන් නැවත ණය ලබාගැනීම සඳහා එකී ශක්‍යතාවය වැදගත්වේ. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි අරමුණ ඉහත පරිදි වේ.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව
2016 වර්ෂය

2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පී.ඊ.ඩී./55 ප්‍රකාර දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත්කර ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරයන් දෙදෙනෙක් සහ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකද ඇතුලත් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. කොමසාරිස් මණ්ඩලය නියෝජනය කරන භාණ්ඩාගාර නියෝජිත, එහි සභාපති ලෙස ද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත නිරීක්ෂක වශයෙන් ද සහභාගී වේ. ප්‍රධාන විධායක නිලධාරී කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ.

(01) 2012 - 2015 වර්ෂවල මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරිම

2012 සහ 2015 වර්ෂවලට අදාළ මූල්‍ය ප්‍රකාශන ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ස්ථාපිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS) අනුව පිළියෙල කර විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ඉදිරිපත්කිරීමට අවශ්‍ය මගපෙන්වීම් සහ උපදෙස් ලබාදීම.

(02) හිඟ ණය අයකිරීම

අක්‍රිය තත්වයේ පවතින ණය මුදල් අයකිරීම සඳහා පළාත් පාලන ආයතන සමග සාකච්ඡාකර එම ආයතන වලට ගෙවීමට හැකි වාරික මුදලකට ණය මුදල ප්‍රතිව්‍යුහගතකර අයකිරීමටත්, පළාත් මට්ටමින් යොමුකර ඒ සඳහා ප්‍රමුඛත්වය ලබාදී සාකච්ඡා කිරීමත් නැතහොත් නීතිමය පියවර ගැනීම සඳහා කොමසාරිස් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නිර්දේශ කර ඇත.

(03) සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

ආයතනයේ 2015 -2020 කාලපරිච්ඡේදයට අදාළ සංයුත්ක සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

(04) පරිගණක මෘදුකාංග පද්ධතිය

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අරමුණු සහ පරමාර්ථ ඉටුකරගැනීමේදී ඉහළ කළමනාකරණයට වඩාත් නිවැරදි තීරණ ගැනීම සඳහා වඩාත් සත්‍ය වූ නිවැරදි තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව කමිටුව විසින් පෙන්වා දෙන ලදී. ඒ අනුව දැනට පවතින පද්ධතියේ අඩුපාඩු සකස් කරගනිමින් කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් විධිමත් පද්ධතියක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබාදීම.

(05) පුරප්පාඩු පිරවීම

පුරප්පාඩුව පවතින තනතුරු සඳහා කඩිනමින් පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා අදාළ බඳවා ගැනීම් සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

2016 වර්ෂයේ කමිටු සාමාජිකයින්

එච්.ටී.කමල් පත්මසිරි මහතා	ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	සභාපති
ඩබ්.එම්.එම්.බී.එච්.ගුණරත්න මහතා	භාණ්ඩාගාර නියෝජනය	සාමාජික
එස්.එන්.ආර්.සුභසිංහ මහතා	ප්‍රධාන විධායක නිලධාරී - දේශීය ණය සහ සංවර්ධන අරමුදල	සාමාජික
ආර්.එම්.ධර්මලතා මහත්මිය	අභ්‍යන්තර විගණක (පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය)	සාමාජික
යූ.යූ.පී.පෙරේරා මහත්මිය	විගණකාධිපති දෙපාර්තමේන්තුව	නිරීක්ෂක

මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	ඩබ්ලිව්එන්පී2/සීබී/එච්/ එල්එල්ඩීඑෆ්/එෆ්ඒ/2016	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2018 ඔක්තෝබර් 09 දින

සභාපති,
දේශීය ණය සහ සංවර්ධන අරමුදල.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 මැයි 18 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
18 OCT 2018

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම්කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

18 OCT 2018

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **අහිතකර මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

2.2.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සභාපති, විධායක නිලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු අත්සන් කර තිබුණ ද, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණයේ වගකීම පිළිබඳ සහතිකය ඇතුළත් කර නොතිබුණි.

2.2.2 **ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම**

ආයතනය විසින් විධිමත් පරිදි ගිණුම් පොත්පත් පවත්වාගෙන ගොස් නොතිබූ අතර ගිණුම්ගත කළ යුතු සියලු ගනුදෙනු ලෙජර් ගිණුම්වලට ඇතුළත් කිරීම සහ වර්ෂය අවසානයේ ලෙජර් ගිණුම් තුලනය කිරීම සිදු කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ශේෂවල නිවැරදිතාවය ලෙජර් ගිණුම්වලින් සනාථ කර ගැනීමට විගණනයේදී නොහැකි වූ අතර ජංගම වත්කම් යටතේ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂ ලෙස රු. 2,501,824 ක් සහ ජංගම බැරකම් යටතේ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂ ලෙස රු.22,063,699 ක ශේෂයක් ඇතුලත්කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුලනය කර තිබුණි.

2.2.3 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

(i) ප්‍රමිතයේ 10 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන සමග හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

3

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
16 OCT 2018

(ii) ආයතනයේ ක්‍රියාකාරීත්වය මූල්‍ය ආයතනයක ක්‍රියාකාරීත්වයට සමාන වන බැවින් ප්‍රමිතයේ 60 ඡේදය ප්‍රකාරව, වත්කම්/වගකීම් ද්‍රවශීලතාවයේ අනුපිළිවෙලට වර්ගීකරණය කළ යුතු බව දක්වා තිබුණ ද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 61 ඡේදය ප්‍රකාරව අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට අපේක්ෂා කරන අයිතමයන් වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව මාස 12 නොඉක්මවූ හා මාස 12 ඉක්මවූ ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කලයුතු වුවත් කාර්යමණ්ඩල ණයගැතියන්, අනෙකුත් ණයගැතියන් හා භාණ්ඩාගාරයෙන් ලබාගත් ණය සම්බන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මූල්‍ය ආයතනවල පොලී ගෙවීම් සහ පොලී ලැබීම් එහි මෙහෙයුම් කාර්යයන් ලෙස දැක්විය හැකි නමුත් අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී අරමුදලට අදාල පොලී ගෙවීම් රු.155,603,616 ක් හා පොලී ලැබීම් රු.305,633,906 ක් ලාභයට නැවතත් එකතු කර දක්වා තිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය වටිනාකම රු.3,270,293 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු. 3,776,138 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමට පෙර මුදල් ප්‍රවාහය රු. 505,845 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, ණය ගැතියන් අඩුවීම රු.388,761,890 ක් වුවත් කාරක ප්‍රාග්ධන අයිතම වෙනස් වීම් යටතේ එය රු.399,363,835 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ගලා ඒම් රු.10,601,945 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(iv) පළාත් පාලන ආයතනවලට ලබාදෙන ලද ප්‍රදාන (Grant given to LA – LGIIP) ක්‍රමක්ෂය රු. 54,773,440 ක වටිනාකම මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී බදු පෙර ලාභයට ගැලපීම් කලයුතු වුවද කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ගැලපීම්කර තිබුණි.

4

(v) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොලී ගිණුමේ වැඩි වීම රු.72,318,793 ක් වූ අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස් වීම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දැක්විය යුතු වුවද එය රු. 94,084,745 ක මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි.

(vi) පළාත් පාලන ආයතන වෙත දෙන ලද ණය, ණයගැතියන් තුලින් නියෝජනය වී තිබූ නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ නැවතත් පළාත් පාලන ආයතන වෙත ණය ගෙවීම් ලෙස රු. 144,644,000 ක් දක්වා තිබුණි.

(vii) සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත කර තිබූ ණය හානිකරණ වටිනාකම රු. 142,363,848 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ගැලපීම් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12

ප්‍රමිතයේ 79 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බදු වියදමේ / වගකීමේ ප්‍රධාන කොටස් වෙන වෙනම හඳුනාගෙන හෙළිදරව්කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i) ප්‍රමිතයේ 55 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම එය පාවිච්චි කිරීම සඳහා සුදුසු තත්ත්වයට ගෙන ආපසු ආරම්භ කළයුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස වත්කම් මිලදීගත් වර්ෂයේදී ක්ෂය නොකරන බව දක්වමින් ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණි.

(ii) ප්‍රමිතයේ 73(අ) සහ (ඇ) ඡේද ප්‍රකාරව, සියලුම වත්කම් පන්ති සඳහා භාවිතා කරන ක්ෂය ක්‍රමය, ඵලදායී ජීව කාලය හෝ ක්ෂය අනුපාතය හෙළිදරව් කිරීම කල යුතු වුවත් පරිගණක, දෘඩාංග සහ නවීකරණ වත්කම් සඳහා භාවිතා කරන ක්ෂය, ක්ෂය අනුපාතය හෝ ඵලදායී ජීව කාලය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

ප්‍රමිතයේ 140(අ), 141(ආ), (ආ), (ඇ) සහ (ඈ) ඡේද ප්‍රකාරව, පශ්චාත් සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් ශුද්ධ ප්‍රතිලාභයේ වගකීම් (වත්කම්), වර්තමාන සේවා පිරිවැය, පොලී ආදායම හෝ වියදම, ශුද්ධ ප්‍රතිලාභයේ වගකීමේ/වත්කමේ නැවත ගණනය සහ අතීත සේවා පිරිවැය ආරම්භක ශේෂයේ සිට අවසාන ශේෂය දක්වා සැසඳුමක් වශයෙන් හෙළිදරව් කළයුතු වුවද, එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

5

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
18 OCT 2018

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක දේශීය ණය සහ සංවර්ධන අරමුදල පවත්වාගෙන ගොස් ඇති අතර රජයේ තීරණයක් මත පකිස්තානු මහ කොමසාරිස් කාර්යාලයට මෙම ගොඩනැගිල්ල සහිත ඉඩම පවරාදී තිබුණි. එහෙත් නිත්‍යානුකූල හිමිකමක් හෝ තාවකාලික හිමිකමක් නොමැති එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා අරමුදල විසින් දරන ලද රු.3,851,639 ක් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබූ නමුත් එම වත්කම් ලියාහැරීම සඳහා ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය ලෙස රු.5,275,731 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 හි 12 ඡේදය ප්‍රකාරව ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායමක් ලෙස හඳුනාගැනීම සඳහා ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල ශුද්ධ අගය රු.12,838,773 ක් වුවද විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් අංක 1 හි ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් එය රු. 16,069,192 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණවල ශුද්ධ අගය රු. 3,230,419 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයට අදාළ ගෘහ භාණ්ඩ සවිකිරීම් (Furniture and Fittings) වල වාර්ෂික ක්ෂය වටිනාකම රු. 275,298 ක් වුවද විගණනය වෙත ලබාදුන් උපලේඛනය අනුව එම වටිනාකම රු. 30,328 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය රු. 244,970 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) නවීකරණ (LLDF Modernization Assets) වත්කම් පංතිය යටතේ ගිණුම්ගත කර තිබූ පරිගණකවල (Laptops) පිරිවැය, පරිගණක දෘඩාංග, මෘදුකාංග හා කාර්යාල උපකරණ ගිණුමට මාරු කර තිබුණ ද එම වත්කමට අදාළ රු.2,395,166 ක සමුච්චිත ක්ෂය වටිනාකම අදාල ක්ෂය වෙන්කිරීමේ ගිණුමට මාරු කර නොතිබුණි. තවද, එම වත්කම් ක්ෂය කළ හැකි වටිනාකම ඉක්මවා රු. 198,041 ක් ක්ෂය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා වත්කම්වල ශුද්ධ අගය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

6

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල මගින් ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්වල (REPO) ආයෝජන වටිනාකම රු. 180,600,000 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණද බැංකු ශේෂ සනාථන අනුව රු. 180,000,000 ක් වූයෙන් ආයෝජන වටිනාකම රු. 600,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට කොමසාරිස් මණ්ඩල අත්තිකාරම් ලෙස රු. 329,400 ක් දක්වා තිබුණ ද මෙම වටිනාකම 2016 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙනවිත් නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් එම ගිණු මේ ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු.2,915,417 ක් වුවද 2016 ජනවාරි 01 දිනට එම වටිනාකම රු. 4,609,931 ක් ලෙස ඉදිරියට ගෙන ඒම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන් කිරීම් ගිණුමේ ශේෂයද රු. 1,694,514 කින් අධි ගණනය වී තිබුණි.

(උ) 2016 වර්ෂයට අදාලව ඉකුත් වර්ෂයේදී ලැබී තිබූ රු.2,662,767 ක ණය වාරික වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ණයගැති ගිණුමට බැර කිරීමෙන් තොරව තවදුරටත් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාළ සභාපති සඳහා දීමනා (Allowance for Chairman) රු. 1,197,325 ක් දෙවරක් ගිණුම් ගතකර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු. 2,773,976 ක් සහ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන මත පොලී ආදායම් රු. 2,539,706 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) 2016 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) යටතේ භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොලිය රු.18,243,168 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඔ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු ලෙස රු.360,000 ක වෙන්කිරීම් කර තිබුණද එම වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

2016 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයන් 9 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.960,711,969 ක් වුවද ඊට අදාල උපලේඛන/ලෙජර් ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.1,166,388,480 ක් වූයෙන් රු.382,727,868 ක වෙනසක් නිරීක්ෂණය විය.

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ගිණුම් විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	උපලේඛනය අනුව වටිනාකම රු.	ලෙජර් ගිණුම් අනුව වටිනාකම රු.	වෙනස රු.
(අ)	ණයගැතියෝ	119,843,374	129,925,205		10,081,831
(ආ)	ලැබිය යුතු ණය පොලී	203,937,342	477,673,989		273,736,647
(ඇ)	දේපල, පිරියත හා උපකරණ	15,463,246	9,927,804		5,535,442
(ඈ)	පරිගණක දෘඩාංග, මෘදුකාංග හා කාර්යාල උපකරණ ආරම්භක ශේෂය	75,463	6,895,602		6,820,139
(ඉ)	පොලී ආදායම	305,633,907	290,822,282		14,811,625
(ඊ)	ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්	46,629,168	36,638,566		9,990,602
(උ)	බැංකු ජංගම ගිණුම් 03 ක ශේෂ	199,156,820	-	146,025,749	53,131,071
(ඌ)	ආයෝජන	52,628,805	49,255,849		3,372,956
(එ)	දේපල ණය	475,053	2,038,525		1,563,472
(ඒ)	ආපදා ණය	4,882,506	3,198,624		1,683,883
(ඔ)	පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අත්තිකාරම්	11,986,285	-	13,986,285	2,000,000
	එකතුව	**960,711,969**	**1,006,376,446**	**160,012,034**	**382,727,868**

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

8

දේශීය ණය සහ සංවර්ධන අරමුදල 18 OCT 2018 අංක: 24/ඊ, පොඩ පෙදෙස, කොළඹ 07

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	ගිණුම් විෂයය	වටිනාකම රු.	නොසැපයූ විගණන සාක්ෂි
(අ)	ස්ථාවර තැන්පතු ආයෝජන	24,640,898	ශේෂ තහවුරු කිරීම්,ස්ථාවර තැන්පතු සහතික
(ආ)	ආපසු අයකර ගත හැකි තැන්පතු	40,052	විස්තරාත්මක ගණනය කිරීම්/උපලේඛන
(ඇ)	බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) සඳහා ණය පොලිය	4,077,810	
(ඈ)	පළාත් පාලන ආයතනවලට ලබා දී ඇති ණය මුදල්වල අඩංගු ප්‍රදාන කොටස ලියා හැරීම.	54,773,440	
(ඉ)	ණය හානිකරණය	142,363,848	
(ඊ)	අත්තිකාරම් ලැබීම්	51,698,087	
(උ)	පාරිතෝෂිත සඳහා වෙන්කිරීම්	1,694,514	ආයුගණක තක්සේරු වාර්තාව

2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම්
(අ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 භාණ්ඩාගාර චක්‍රලේඛය	ස්ථාවර වත්කම්වලට අදාල සියලු තොරතුරු නිවැරදිව ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(ආ)	2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පරිගණක හා පරිගණක උපාංග පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.

9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,569,413 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 4,226,494 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 657,081 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.61.375,457 කින් වැඩි වී තිබුණද වියදම රු. 62,032,538 කින් වැඩි වීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයෙහි අඛණ්ඩ ඌනතාවයක් ඇති වී තිබූ නමුත් එම ඌනතාවය රු. 337,504,858 ක සිට රු.135,412,981 ක් දක්වා අඛණ්ඩව අඩුවී තිබූ අතර 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු.4,226,504 ක හා රු.3,560,413 ක අතිරික්තයක් ඇති වී තිබුණි. තවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම්වලට අදාල ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සෘණ දායකත්වයක් ඇතිවී තිබූ නමුත් එය රු. 106,622,894 ක සිට 18,499,306 ක් දක්වා අඩුවී තිබුණි. කෙසේ වුවද, 2015 වර්ෂයේ දායකත්වය රු. 53,215.095 ක ධන අගයක් ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. 173,248,771 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

ආයතනය විසින් 2016 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එය 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

10

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා එම ආයතනවල ස්ථාවර වත්කම් සංවර්ධනය කිරීමට ණය ලබාදීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP), නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) සහ නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) මගින් ලබාදෙන ලද ණය මුදල්, එකී පළාත් පාලන ආයතනවලින් පොලිය ද සමග අයකර, මුල් මුදල සහ අය කරන පොලී මුදලෙන් කොටසක් භාණ්ඩාගාරයට ගෙවීමෙන් පසු ශේෂවන මුදලින් හා ආයතනය විසින් පළාත් පාලන ආයතන වෙත ණය ලබාදීම මගින් අය කරන පොලියෙන් අරමුදලේ ආදායම සමන්විත වී තිබුණි. කෙසේ වුවද, 2016 වර්ෂය අවසාන වනවිට වසරකට වඩා වැඩි කාලයක් ක්‍රියාකාරී නොවූ ණය ලැයිස්තුවේ පැවති රු. 552,027,729 ක වටිනාකමින් යුත් ණයශේෂ 28 ක් අතුරින් රු. 104,367,052 ක වටිනාකමින් යුත් ණය ශේෂ 11 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිව්‍යුහගත කිරීම (Reschedule) සිදුකර තිබූ නමුත් ඉතිරි රු. 447,660,677 ක මුදල අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද ආයතනය විසින් හිඟ ණය වාරික හා පොලියට අදාළව කාල විශ්ලේෂණයක්ද සකස්කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල පළාත් පාලන ආයතනවලට ණය ලබා දීම සඳහා රු. 800,000,000 ක මුදලක් වෙන්කර තිබුණ ද පළාත් 5 ක් වෙත රු. 144,648,000 ක් පමණක් ණය වශයෙන් ලබා දී තිබූ අතර ඒ අනුව ප්‍රගතිය සියයට 18 ක් තරම් පහළ අගයක් ගෙන තිබුණි. තවද ණය ලබාදීම පළාත් වශයෙන් විශ්ලේෂණය කිරීමේදී මධ්‍යම, උතුරු මැද, උතුර සහ වයඹ පළාත්වලට කිසිදු ණය මුදලක් සමාලෝචිත වර්ෂයේදී නිදහස් කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පළාත් පාලන ආයතනවලට ණය ලබාදීම හා එම ණය අයකර ගැනීම අරමුදලේ කාර්යය වුවද එම ණය අයකර ගැනීමේදී පොළිය හා ප්‍රාග්ධන කොටස වෙන වෙනම හඳුනාගත හැකි ආකාරයට නිසි ගිණුම් තැබීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේදී පුත්තලම නගර සභාවෙන් රු. 1,391,772 ක් ලැබී තිබුණ ද එම මුදල් එම නගර සභාවෙන් ලැබිය යුතු රු. 27,835,570 ක මුදලින් කොටසක් පියවා ගැනීම සඳහා යොදාගැනීමෙන් තොරව ආපසු හරවා යවා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) 1993 අංක 24 දරන දේශීය ණය සහ සංවර්ධන (සංශෝධන) පනත මගින් සංශෝධිත 1916 අංක 22 දරන දේශීය ණය සහ සංවර්ධන ආඥා පනතේ 03 වගන්තිය ප්‍රකාරව කාර්ය මණ්ඩලය පත්කිරීමේ බලතල කොමසාරිස් මණ්ඩලය සතු වුවද කොමසාරිස් මණ්ඩලයේ අනුමැතියකින් තොරව රාජ්‍ය පරිපාලන පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රිය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගණකාධිකාරී සේවයේ I පංතියේ නිලධාරියෙකු වැඩ බැලීමේ / රාජකාරී ඉටුකිරීමේ පදනම මත ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කර තිබුණි.තවද එම නිළධාරියා වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:5:4 වගන්තිය හා 12:8 වගන්තියට පටහැනිව වැඩ බැලීමේ වැටුප් ලෙස සහ 2008 ජූලි 28 දිනැති අංක පීඊඞී/50 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 ඡේදය හා 2015 මැයි 25 දිනැති අංක පීඊඞී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.7 ඡේදයට පටහැනිව ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස එකතුව රු.1,244,905 ක් ගෙවා තිබුණි.

5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

ආයතනය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබූ අතර රේඛීය අමාත්‍යාංශය මගින් හෝ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු සම්බන්ධයෙන් වරින්වර ආයතනයේ සභාපතිවරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

පද්ධති පාලන හා ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය හා පොත්පත් පවත්වාගෙන යාම.	(i) ආයතනයේ ගනුදෙනු නිසි පරිදි සටහන් නොකිරීම හා ගිණුම් පොත්පත් නිවැරදිව පවත්වාගෙන නොයාම. (ii) ආයතනය විසින් 2012 වර්ෂයේදී මිලදීගෙන, ස්ථාපිත කළ පරිගණක පද්ධතිය යාවත්කාලීන කර, ගිණුම්කරණ හා මෙහෙයුම් කටයුතු සිදු නොකිරීම.

12

NAOSL

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ආ) ණය පාලනය	ආයතනයට ලැබිය යුතු ණය වාරික සහ පොලිය අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් දියත් නොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

13

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය

(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

2016-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

	සටහන්	**2016** රු. ශත.	**2015** රු. ශත.
ආදායම			
පොළී ආදායම	18	305,633,906.48	279,685,699.97
භාණ්ඩාගාර ණය පොළී	19	(127,908,656.43)	(152,715,453.30)
දළ ආදායම		**177,725,250.05**	**126,970,246.67**
වෙනත් ආදායම්	20	5,177,779.63	441,966.01
පරිපාලන වියදම්	21	(33,932,782.29)	(27,851,969.80)
පළාත් පාලන ආයතන වෙත විශේෂ ප්‍රදාන	22	(54,773,440.00)	(89,883,001.70)
මෙහෙයුම් අලාභය		**94,196,807.39**	**9,677,241.18**
ණය හානිකරණය සහ අනෙකුත් අලාභයන්		(142,363,847.63)	(26,441,969.00)
මූල්‍ය වියදම්		-	-
මූල්‍ය ආදායම	23	52,628,804.92	21,937,368.12
බදු ගෙවීමට පෙර ලාභය		**4,461,764.68**	**5,172,640.30**
ආදායම් බදු ගෙවීම්		(892,352.00)	(946,136.00)
ආදායම් බදු වෙන්කිරීම්		-	-
බදු ගෙවීමෙන් පසු ලාභය		**3,569,412.68**	**4,226,504.30**
ඒකාබද්ධ අරමුදලට ගෙවීම්		-	-
ශුද්ධ ලාභය		3,569,412.68	4,226,504.30
වර්ෂ ආරම්භයේ රඳවාගත් ඉපැයුම්		(935,525,797.79)	(939,752,302.09)
වර්ෂ අවසානයේ රඳවාගත් ඉපැයුම්		**(931,956,385.11)**	**(935,525,797.79)**

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය

(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

2016-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන්	2016 (රු.)	2015 (රු.)
වත්කම්			
දිගුකාලීන වත්කම්			
ස්ථාවර වත්කම් සහ යන්ත්‍රෝපකරණ	1	16,069,191.60	16,069,191.60
මූල්‍ය වත්කම් ආයෝජන කල්පිරීම්	2	816,434,637.66	127,296,453.58
ප්‍රදානයන් - ප.පා.ය.ප.වැ.ව	3	1,179,508,027.99	1,234,281,467.99
සේවක ණය	4	5,376,809.18	5,059,368.52
මුළු දිගුකාලීන වත්කම්		**2,017,388,666.43**	**1,382,706,481.69**
ජංගම වත්කම්			
ණය ගැතියෝ	5	2,832,526,140.39	3,231,889,975.71
ලැබිය යුතු ණය පොළී	6	203,937,341.83	193,335,396.12
ආපසු ලබාගත හැකි තැන්පතු	7	40,051.61	40,051.61
ලැබිය යුතු ආයෝජන ආදායම් (UDLIHP)		589,275.95	2,522,742.00
අවිනිශ්චිත ගිණුම - ප.පා.ය.ප.වැ.ව		2,501,823.79	-
මූල්‍ය ශේෂය (PMU)		-	19,500,745.64
මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය	8	193,405,182.75	282,014,936.93
මුළු ජංගම වත්කම්		**3,232,999,816.32**	**3,729,303,848.01**
මුළු වත්කම්		**5,250,388,482.75**	**5,112,010,329.70**
වගකීම්			
හිමිකම් (Equity)	9	(935,525,787.79)	(935,525,787.79)
රඳවාගත් ඉපැයුම්		3,569,412.68	4,226,504.30
මුළු සමකොටස්		(931,956,385.11)	(935,525,787.79)

වගකීම්

දිගුකාලීන වගකීම්

භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය	10	1,980,157,230.26	2,006,099,126.54
ගෙවිය යුතු ණය - ප.පා.ය.ප.වැ.ව	10	3,549,802,284.69	3,551,530,832.49
ප්‍රදානයන් - ප.පා.ය.ප.වැ.ව	11	482,236,858.92	392,754,314.94
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	12	6,304,445.42	2,915,417.20
ගෙවිය යුතු රඳවා ගැනීම්		-	-
රාජ්‍ය අනුග්‍රහය (ප්‍රාග්ධන) - ප.පා.ය.ප.වැ.ව	13	5,275,731.07	5,275,731.07
මුළු දිගුකාලීන වගකීම්		**6,023,776,550.36**	**5,958,575,422.24**
ජංගම වගකීම්			
භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු පොළී	14	94,084,744.99	21,765,947.75
අවිනිශ්චිත පොළී ලැබීම්		-	22,063,699.27
උපචිත වියදම් වෙන්කිරීම්	15	10,220,357.11	8,887,813.00
පෙර වර්ෂය සඳහා ලැබීම්	16	51,698,086.78	15,623,576.97
බදු වගකීම	17	2,565,128.62	1,118,912.62
ජංගම වගකීම් - ප.පා.ය.ප.වැ.ව		-	19,500,745.64
මුළු ජංගම වගකීම්		**158,568,317.50**	**88,960,695.25**
මුළු වගකීම්		**5,250,388,482.75**	**5,112,010,329.70**

එච්.ටී.කේ.පත්මසිරි
සභාපති
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
(ලේකම් - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය)

ඩබ්.එම්.එම්.බී.එච්.ගුණරත්න
භාණ්ඩාගාර නියෝජිත
කොමසාරිස් මණ්ඩලය
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
(අධ්‍යක්ෂ - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව)

ඒ.කේ.පී.එස්.අමරසිරි
ප්‍රධාන විධායක නිලධාරී
දේශීය ණය සහ සංවර්ධන අරමුදල

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)
2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2016**	**2015**
	(රු.)	(රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්		
බදු ගෙවීමට පෙර ලාභය	4,461,764.68	(119,510,657.34)
එකතු කිරීම්		
පොළී ගෙවීම්	155,603,616.20	-
පොළී ලැබීම්	305,633,906.48	(21,937,368.12)
ක්ෂය වෙන්කිරීම්	3,776,137.65	3,270,293.40
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	1,694,514.11	565,917.08
පෙර වර්ෂය සඳහා ගැලපීම්	-	-
අවිනිශ්චිත ගිණුම	-	22,262,753.65
කාරක ප්‍රාග්ධනයේ ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය	**471,169,939.12**	**(115,348,168.58)**
අඩුවීම / වැඩිවීම - ණය ගැතියෝ	399,363,835.32	155,741,641.21
අඩුවීම / වැඩිවීම - ප්‍රධාන - ප.පා.ය.ප.වැ.ව	54,773,440.00	293,184,673.03
අඩුවීම / වැඩිවීම - පෙර වර්ෂය සඳහා ලැබීම්	-	4,632,604.50
අඩුවීම / වැඩිවීම - සේවක ණය ගැතියෝ	(317,440.66)	(926,686.01)
අඩුවීම / වැඩිවීම - භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය පොළී	(94,084,744.99)	(95,329,229.14)
අඩුවීම / වැඩිවීම - වෙළඳ ණය ගැතියෝ සහ වෙනත් ගෙවීම්	-	(155,331.92)
අඩුවීම / වැඩිවීම - ලැබීම්	(27,670,444.08)	(113,005,818.51)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්	**332,064,645.59**	**128,793,684.58**
භාණ්ඩාගාරයට පොළී ගෙවීම්	(55,589,859.19)	-
පොළී ලැබීම්	5,177,779.63	21,937,368.12
රඳවා ගැනීම් බදු		(404,938.88)
ආදායම් බදු ගෙවීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන්	**752,822,505.15**	**150,326,113.82**
ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්		
ස්ථාවර වත්කම් සහ යන්ත්‍රෝපකරණ	(39,875.00)	(587,387.50)
ස්ථාවර වත්කම් බැහැර කිරීම	-	-
ස්ථාවර තැන්පතු	(508,000,000.00)	205,000,000.00
භාණ්ඩාගාර බිල්පත්	-	(36,210,886.15)
ප්‍රතිමිලදීගැනීම් (REPO)	(180,600,000.00)	
ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන්	**(688,639,875.00)**	**168,201,726.35**
මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්		
ණය නිකුත්කිරීම්	(144,644,000.00)	(799,500.00)
ණය අයකිරීම්	(27,649,074.93)	(113,819,127.35)
මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(172,293,074.93)**	**(114,618,627.35)**
අඩුවීම / වැඩිවීම - වර්ෂය තුළ වූ මූල්‍ය විචල්‍යයන්	**(108,110,499.82)**	**203,909,212.82**
වර්ෂය ආරම්භයේ වූ මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය (සටහන A)	**301,515,682.57**	**97,606,469.75**
වර්ෂය අවසානයේ වූ මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය (සටහන A)	**193,405,182.75**	**301,515,682.57**

සටහන A

මූල්‍ය විචලයයන්	**2016**	**2015**
	රු. ශත	රු. ශත .
ඉතිරි කිරීමේ ගිණුම	199,156,819.98	484,004,042.15
මුදල් ශේෂය PMU	19,500,745.64	19,500,745.64
බැංකුවේ ඇති මුදල්	(5,751,637.23)	(201,989,105.22)
වර්ෂය අවසානයේ වූ මූල්‍ය විචල්‍යයන්ගේ ශේෂය	**193,405,182.75**	**301,515,682.57**

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
ශේෂ පත්රය සඳහා සටහන්
2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1 **ස්ථාවර වත්කම්**
පිරිවැය

විස්තරය	01.01.2016 දිනට පිරිවැය	එකතු කිරීම්/ බැහැරකිරීම්	31.12.2016 දිනට පිරිවැය
කාර්යාල ගොඩනැගිලි	2,357,469.16	39,875.00	2,397,344.16
ගෘහභාණ්ඩ සහ උපකරණ	5,624,472.62	-	5,624,472.62
පරිගණක දෘඩාංග, මෘදුකාංග සහ කාර්යාල උපකරණ	75,463.05	-	6,895,602.00
වත්කම් - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	4,511,406.98	-	4,511,406.98
මෝටර් රථ - නිසාන් Xtrail	**7,995,000.00**	-	7,995,000.00
එකතුව	**20,563,811.81**	**39,875.00**	**27,423,825.76**

සමුච්චිත ක්ෂය වෙන්කිරීම්

විස්තරය	01.01.2016 දිනට ශේෂය	අදාළ වර්ෂය සඳහා ක්ෂය	31.12.2016 දිනට ශේෂය
කාර්යාල ගොඩනැගිලි	2,055,616.98	75,463.05	2,131,080.03
ගෘහභාණ්ඩ සහ උපකරණ	1,444,958.17	275,298.08	1,720,256.25
පරිගණක දෘඩාංග, මෘදුකාංග සහ කාර්යාල උපකරණ	2,862,430.28	1,008,292.93	3,870,723.21
වත්කම් - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	2,553,253.73	312,239.34	2,865,493.07
මෝටර් රථ - නිසාන් Xtrail	2,398,500.00	1,599,000.00	3,997,500.00
එකතුව	**11,314,759.16**	**3,270,293.40**	**14,585,052.56**

ලියා හරින ලද අගය	**19,551,597.50**		**16,069,191.60**

02	මූල්‍ය වත්කම් - ආයෝජන කල්පිරීම්	2016	2015
	ස්ථාවර තැන්පතු	539,855,292.05	31,855,292.05
	භාණ්ඩාගාර බිල්පත්	95,979,345.61	95,441,161.53
	REPO ආයෝජන	180,600,000.00	-
		816,434,637.66	**127,296,453.58**

03	පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන (ප.පා.ය.ප.වැ.කි.ව)	2016	2015
	2016 වර්ෂයේදී ප. පා. ආයතන වෙත ලබාදුන් ප්‍රදාන	1,234,281,467.99	2,841,795,121.45
	අඩුකලා - ප්‍රදාන (2016 ක්‍රමක්ෂය)		(1,607,513,653.46)
		1,234,281,467.99	**1,234,281,467.99**

04	සේවක ණය	2016	2015
	ආපදා ණය	4,882,506.16	4,709,468.52
	කොමසාරිස් මණ්ඩල අත්තිකාරම්	-	329,400.00
	උත්සව අත්තිකාරම්	19,250.00	20,500.00
	දේපළ ණය	475,053.02	-
		5,376,809.18	**5,059,368.52**

05	දිගුකාලීන වත්කම් - ණය ගැතියෝ	2016	2015
	දේ.ණ.ස.අ (ම.න.ස, න.ස සහ ප්‍රා.ස)	944,728,866.44	944,012,416.91
	නා. සං. සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය	1,403,917,341.01	1,511,126,201.48
	ප. පා. ය.ප. වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	1,336,893,510.29	1,482,905,605.75
	බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය	62,201,424.12	66,198,530.41
	ජාතික ජල සම්පාදන සහ ජලාපවාහණ මණ්ඩලය	7,720,755.22	8,219,130.22
		3,755,461,897.08	**4,012,461,884.77**
	අඩු කළා - වර්ෂය සඳහා වෙන්කිරීම්		
	2016.01.01 දිනට ශේෂය	780,571,909.06	754,129,940.06
	එකතු කළා - වර්ෂය සඳහා වෙන්කිරීම්	142,363,847.63	26,441,969.00
		922,935,756.69	**780,571,909.06**
	2016.12.31 දිනට ශේෂය	**2,832,526,140.39**	**3,231,889,975.71**

6	ලැබිය යුතු පොළී - දිගුකාලීන	2016	2015
	ලැබිය යුතු ණය පොළී - LLDF	14,714,360.20	23,917,564.30
	ලැබිය යුතු පොළී - UDLIHP	103,269,071.74	92,611,890.63
	ලැබිය යුතු පොළී - PCDP	8,466,173.78	4,680.00
	ලැබිය යුතු පොළී - LGIIP	39,268,965.76	75,757,996.15
	භාණ්ඩාගාරයෙන් ලාබිය යුතු පොළී - LGIIP	-	-
	ලැබිය යුතු ප්‍රමාණීකෘත වන්දි - LGIIP	1,043,265.04	1,043,265.04
	ලැබිය යුතු අමතර පොළී - LGIIP	-	-
	ජා.ජ.ස. සහ ජලාපවහන මණ්ඩලය	37,175,505.31	-
		203,937,341.83	**193,335,396.12**

අක්‍රිය ණය - LL&DF	-	-
අක්‍රිය ණය - PCDP	-	-
අක්‍රිය ණය - UDLIHP	-	-
	203,937,341.83	**193,335,396.12**

7 **ලැබිය යුතු ආයෝජන ආදායම් - UDLIHP**	**2016**	**2015**
ලැබිය යුතු පොළී (භාණ්ඩාගාර බිල්පත්) - UDLIHP	-	1,306,001.00
ලැබිය යුතු පොළී (ස්ථාවර තැන්පතු) - UDLIHP	589,275.95	1,216,741.00
	589,275.95	**2,522,742.00**

8 **මූල්‍ය විචලනයන්**	**2016**	**2015**
ඉතිරිකිරීමේ ගිණුම	199,156,819.98	484,004,042.15
අතැති මුදල්	(5,751,637.23)	(201,989,105.22)
	193,405,182.75	282,014,936.93

9 **රඳවාගත් ඉපැයුම්**	**2016**	**2015**
2016.01.01 දිනට ශේෂය	(935,525,787.79)	(939,752,302.09)
2016 වර්ෂය සඳහා	3,569,412.68	4,226,514.30
	(931,956,375.11)	(935,525,787.79)

10 **භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය**	**2016**	**2015**
භාණ්ඩාගාර ණය අරමුදල්	193,231,585.26	215,192,375.25
නා.ස.අ.ආ.නි.ව	1,724,989,810.44	1,724,989,810.44
බහු.හෝ.සං.ව්‍යා	61,935,834.56	65,916,940.85
ප.පා.ය.ප.වැ.ව	3,549,802,284.69	3,551,530,832.49
	5,529,959,514.95	5,557,629,959.03

11	පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන - ප.පා.ය.ප.වැ.ව	2016	2015
	ප්‍රදාන - ලැබීම්	1,102,964,884.09	1,102,964,884.09
	අඩුකළා - 2016 ප්‍රදාන ක්‍රමක්ෂය	(620,728,025.17)	(710,210,569.15)
		482,236,858.92	392,754,314.94

12	පාරිතෝෂික ගෙවීම්	2016	2015
	පාරිතෝෂික වෙන්කිරීම්	4,609,931.31	2,348,607.37
	වර්ෂය සඳහා වෙන්කිරීම්	1,694,514.11	566,809.83
		-	2,915,417.20
	වර්ෂය සඳහා පාරිතෝෂික ගෙවීම්	-	-
		6,304,445.42	2,915,417.20

13	මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් වාරික - ප.පා.ය.ප.වැ.ව	2016	2015
	වත්කම් - LGIIP (පිරිවැය)	-	7,500,110.62
	අඩුකළා - භාණ්ඩාගාරයෙන් ලැබීම් (ක්‍රමක්ෂය)	5,275,731.07	(2,224,379.55)
		5,275,731.07	5,275,731.07

14	මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු පොළී	2016	2015
	ගෙවිය යුතු පොළී UDLIHP	94,084,744.99	21,765,947.75
	ගෙවිය යුතු පොළී PCDP	-	-
	ගෙවිය යුතු පොළී LGIIP	-	-
		94,084,744.99	21,765,947.75

15	උපචිත වියදම් සඳහා වෙන්කිරීම්	2016	2015
	විගණන ගාස්තු	2,005,813.00	1,645,813.00
	ආදායම් බදු	7,800,000.00	7,200,000.00
	උපචිත වියදම්	414,544.11	24,000.00
		10,220,357.11	8,887,813.00

16	කලින් ලැබීම්	2016	2015
	කලින් ලැබීම් LLDF	4,744,746.09	2,662,767.18
	කලින් ලැබීම් UDLIHP	7,241,173.20	5,849,401.20
	කලින් ලැබීම් LGIIP	11,986,285.02	7,111,408.59
	ලැබීම් ගිණුම	4,229,404.90	
	අවිනිශ්චිත ලැබීම් ගිණුම	22,063,699.27	
	මුදල් මාරුකිරීම් **(LGIIP)**	1,432,778.30	
		51,698,086.78	15,623,576.97

17	ජංගම බදු වගකීම	2016	2015
	වර්ෂයේ ආරම්භක ශේෂය	1,672,776.62	577,715.50
	එකතු කළා - වර්ෂය සඳහා වෙන්කිරීම්	892,352.00	946,136.00
		-	1,523,851.50
	අඩු කළා - 2014/2015 වර්ෂ සඳහා ගෙවීම්	-	-
	2015/2016 වර්ෂ සඳහා ගෙවීම්	-	-
	අඩු කළා - රඳවාගැනීමේ බදු	-	(404,938.88)
	2016.12.31 දිනට ශේෂය	2,565,128.62	1,118,912.62

18	පොළී ආදායම	2016	2015
	LLDF	81,412,991.55	81,136,093.89
	UDLIHP	92,489,325.69	71,283,893.05
	PCDP	4,813,536.15	4,963,971.00
	LGIIP	126,141,925.74	121,478,644.03
	NW&DB	776,127.35	823,097.90
		305,633,906.48	279,685,699.87

19	පොළී වියදම	2016	2015
	LLDF	15,245,415.45	16,926,385.93
	UDLIHP	72,318,797.24	95,329,229.05
	PCDP	4,863,827.73	4,944,531.00
	LGIIP	35,480,616.01	35,515,308.32
		127,908,656.43	152,715,454.30

20	වෙනත් ආදායම්	2016	2015
	අවිනිශ්චිත ලැබීම්		
	LLDF	-	-
	UDLIHP	-	-
	PCDP	4,007,809.94	-
	LGIIP	-	-
	ද්‍රවශීලතා හානිකරණ ආදායම		
	LLDF	-	-
	UDLIHP	-	-
	PCDP	-	-
	LGIIP	-	167,133.89
	වෙනත් ආදායම්		
	LLDF	254,249.32	274,832.12
	UDLIHP	-	-
	PCDP	-	-
	LGIIP	845,720.37	-
		5,177,779.63	441,966.01

21 **පරිපාලන වියදම්**

	2016	2015
කාර්යමණ්ඩල වැටුප්	11,323,848.45	11,186,753.92
ජීවනාධාර දීමනාව	2,820,480.00	2,948,660.00
ප්‍රසාද දීමනා	58,000.00	-
සභාපති දීමනා	1,197,325.14	842,832.50
දිරි දීමනා - UDLIHP	-	74,000.00
කොමසාරිස් මණ්ඩල ප්‍රවාහන දීමනා	-	201,880.00
සභාපති දීමනා	1,197,325.14	9,000.00
කොමසාරිස් මණ්ඩල දීමනා	1,229,850.50	-
E.P.F	2,794,205.33	1,656,933.50
E.T.F	421,337.54	414,233.38
පාරිතෝෂික දීමනා ගෙවීම්	1,694,514.11	566,809.83
අතිකාල සහ නිවාඩු දින වැටුප්	158,593.90	131,563.67
කාර්යමණ්ඩල සුභසාධක වියදම්	257,415.60	165,814.00
දුරකථන දීමනා	-	35,928.58
සංවර්ධන නිලධාරී දීමනා	-	125,787.10
රැස්වීම් වියදම්	73,814.00	105,771.00
විගණන ගාස්තු ගෙවීම්	-	169,358.33
දුරකථන සහ තැපැල්	117,273.55	361,809.17
ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ වියදම්	400,565.61	597,441.96
වාහන නඩත්තු වියදම්	159,807.00	67,055.00
ඉන්ධන	213,486.67	204,387.75
විදුලි ගාස්තු	699,245.25	620,014.12
ආරක්ෂක ගාස්තු	1,174,650.00	392,341.64
ජල ගාස්තු	72,303.67	34,215.44
පවිත්‍රතා වියදම්	319,541.96	254,745.00
උපකරණ සහ නඩත්තු	505,078.88	126,583.23
ගොඩනැගිලි නඩත්තු	11,655.00	765,647.68
කාර්යමණ්ඩල පුහුණු	1,318,601.00	268,705.00
පරිගණක නඩත්තු වියදම්	43,500.00	1,318,576.00
වරිපනම් සහ බදු	101,110.00	
කාර්යාල කුලී	600,000.00	101,110.00
වැඩමුළු	206,500.00	-
පුවත්පත් දැන්වීම් වියදම්	505,844.25	-
උපකරණ ක්ෂය	75,463.05	75,463.05
ගෘහභාණ්ඩ ක්ෂය	275,298.08	275,298.08
පරිගණක මෘදුකාංග සහ දෘඩාංග ක්ෂය	1,008,292.93	1,008,292.93
LLDF නවීකරණ වත්කම් ක්ෂය	312,239.34	312,239.34
මෝටර් වාහන ක්ෂය	1,599,000.00	1,599,000.00
නීතිඥ ගාස්තු	27,000.00	-
බැංකු ගාස්තු	-	13,053.73
සංවර්ධන නිලධාරී - ගමන් වියදම්	889,472.84	820,664.87
උපයන විට ගෙවීම්	56,850.00	-
වෙනත්	13,294.00	
	33,932,782.29	**27,851,969.80**

22	පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන - LGIIP	2016	2015
	ප්‍රදාන ක්‍රමක්ෂය - වියදම	-	293,184,673.03
	ප්‍රදාන ක්‍රමක්ෂය - ආදායම	(54,773,440.00)	(203,301,671.33)
		(54,773,440.00)	89,883,001.70

23	**මූල්‍ය ආදායම**	**2016**	**2015**
	පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත්		
	LLDF	1,178,539.47	914,363.75
	UDLIHP	-	2,371,411.24
	PCDP	-	-
	LGIIP	1,790,531.75	889,279.21
	පොළී ආදායම - REPO ආයෝජන		
	LLDF	17,691,248.05	708,424.47
	UDLIHP	7,053,711.80	1,155,846.31
	LGIIP	21,884,207.64	1,506,225.92
	පොළී ආදායම - ඉතිරි කිරීමේ ගිණුම		
	LLDF	1,007,472.89	774,738.57
	UDLIHP	216,462.67	815,708.37
	PCDP	-	-
	LGIIP	469,977.78	1,171,952.12
	පොළී ආදායම - ස්ථාවර තැන්පතු		
	LLDF	-	11,398,436.67
	UDLIHP	1,336,652.87	138,630.14
	PCDP	-	-
	LGIIP	-	92,351.35
		52,628,804.92	21,937,368.12

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වාර්තාමය ඒකකය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LL&DF) නෛතික ඒකකයක් වශයෙන් 1916 අංක 22 දරණ දේශීය ණය සහ සංවර්ධන ආඥා පණත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ආංශික මූල්‍ය ප්‍රකාශයන්ද එහි, උප කාර්යයන්ද ආවරණය කරයි. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මෙහෙයුම් තුල ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති වල ණය අයකිරීම් සිදුකරනු ලබයි. එනම් නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP), බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) හා පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) යන උපාංග වේ.

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2008 සිට දේශීය ණය සහ සංවර්ධන අරමුදල තුල ක්‍රියාත්මක වේ. 2016 වර්ෂවල ගිණුම් සහ මූල්‍ය ප්‍රතිඵල ඒකාබද්ධ කර ඇත.

අනුකූලතා ප්‍රකාශන

ශේෂ පත්‍ර, ආදායම් ප්‍රකාශන හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ස්ථාපිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව පිළියෙල කර ඇත.

පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සංකල්පයට අනුව පිළියෙල කර ඇති අතර උද්ධමනය සඳහා ගැලපීම් නොකොට ඒකාග්‍රතාවය සලකා ඇතත් ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට ලක් කොට ඇත.

ශ්‍රිතීය හා ඉදිරිපත් කිරීමේ මුදල්

ආසන්න ශතයට ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

ප්‍රමාණවත් බව හා එක්කාසු කිරීම

සමාන කායීයන් හා ස්වභාවයන් එක්කාසු කරමින් ප්‍රමාණවත් අයිතමයන් වෙන්ව දක්වා ඇත.

ඒකාබද්ධ කිරීමේ පදනම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල, නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP), බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP), පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) උපාංශයන් වශයෙන් හඳුනාගෙන, සෘජු ආදායම් හා වියදම් වෙන්ව දක්වමින්, වර්ෂාවසානයේ එකට ඒකාබද්ධ කොට ඇත. වත්කම් හා වගකීම්ද ශේෂ පත්‍රය තුල ඒකාබද්ධ කොට ඇත.

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ කාර්යයන් (ව්‍යාපෘතියේ B උපාංගය) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට පවරා ඇති අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) මගින් එය ක්‍රියාත්මක වේ. එම අංශය තුල එහි මූල්‍ය ප්‍රකාශන වෙනම පිළියෙල කරනු ලැබේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලට බලනොපාන මෙහෙයුම් වියදම් හා A උපාංගයට නිකුත් කරන ලද මුදල් හැර සියළුම වත්කම් හා වගකීම් ගිණුම් වල තොරතුරු දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ගිණුම් තුල ඒකාබද්ධ කොට ඇත.

ව්‍යාපෘතිය විසින් මිලදී ගෙන සෘජුව දේශීය ණය සහ සංවර්ධන අරමුලට මාරු කරන ලද වත්කම්ද B උපාංගය සඳහා දෙන ලද ණය හා ප්‍රදානයන් හා ඒ සම්බන්ධ ගනුදෙනුද, ඒකාබද්ධ ප්‍රකාශයන්ට පෙර උපාංග මූල්‍ය ප්‍රකාශන වලට ගෙන ඇත.

මුදල් හා මුදල් තුලනයන්

මුදල් හා මුදල් සමානයන් තුල අතැති මුදල්, ස්ථාවර තැන්පතු හා ඉතුරුම් තැන්පත් අදාළ බැංකු ගිණුම් වල ශේෂයන් අන්තර්ගතය. ඒවායේ මතුපිට අගය මත ශේෂය ඉදිරියට ගෙන ඇත.

බැර හා හර ප්‍රදානයන්ගේ ක්‍රමක්ෂය

බැර ප්‍රදානයන් වන්නේ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (LGIIP) B උපාංගය සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය සමග පළාත් පාලන ආයතන වලට නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල්ය. හර ප්‍රදානයන් වන්නේ පළාත් පාලන ආයතන වෙත ණය සමග නිකුත් කරන ලද ආධාර මුදල්ය. වියදමක් වශයෙන් සලකන ලද හර ප්‍රදානයන් අදාල කාර්යයෙන් ලැබෙන පොළී වලට අනුකූලව ක්‍රමවත් පදනමකට වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර එම පදනමට අනුකූලව බැර ප්‍රදානයන්ද ක්‍රමක්ෂය කරනු ලැබේ. මෙම වැඩපිළිවෙලේදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ බදුවලට පෙර ඒකාබද්ධ ලාභය බද්දට පෙර හා ශුද්ධ ක්‍රමක්ෂයට පෙර ලාභයෙන් 5% කට වඩා අඩු නොවිය යුතුය.

අක්‍රිය ණය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ස්ථාපිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව දීර්ඝ කාලයක් නොලැබී තිබූ ණය වල ප්‍රාග්ධන කොටස හා පොළිය අක්‍රීය වූ ණය හා පොළී ලෙස සලකා පොළිය අවිනිශ්චිත වූ පොළී ගිණුමක උපචිත කරන අතර එය නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

පාඩු වූ ණය සඳහා ප්‍රතිපාදන

පාඩු වූ ණය හා සැක සහිත ආපසු අයකරගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් විශේෂ ප්‍රතිපාදනයන් කරනු ලැබේ.

අක්‍රීය ණය මත ආදායම් හඳුනාගැනීම

කිසියම් අත්තිවාරමක්/ ණයක් අක්‍රීය ලෙස සැලකූ කල පොළිය ආදායමක් වශයෙන් ගැනීම අත්හිටුවන අතර මුදල් පදනම මත පමණක් එය ආදායමට ගනු ලැබේ.

ක්ෂයවීම්

එක් එක් වත්කම් පංතිය අනුව පහත සඳහන් ලෙස සරල මාර්ග ක්‍රමයට ක්ෂයවීම් ප්‍රතිපාදනය කරනු ලැබේ.

සවිකිරීම්	-	25%
කාර්‍යාල උපකරණ	-	20%
කාර්‍යාල ලී බඩු	-	05%
වාහන	-	20%

වත්කම් මිලයට ගත් වර්ෂයේ ක්ෂයවීම් ගණනය කරනු නොලැබේ.

දේපල හා යන්ත්‍රෝපකරණ

දේපල හා යන්ත්‍රෝපකරණ ඒවා මිලට ගත් පිරිවැය හෝ ඉදිකිරීම් පිරිවැය හෝ අනියම් වියදම් සහිත අගය කිරීම් වලින් ක්ෂයවීම් අඩු කොට වාර්තා කරනු ලැබේ. ඉදිකිරීම් වත්කම් භාවිත තත්වයට ගෙන ඒම සඳහා වූ වියදම් සියල්ල පිරිවැය තුල අන්තර්ගතය. කොන්ත්‍රාත් මත වූ ඉදිකිරීම් වල ගෙවන ලද කොන්ත්‍රාත් මිල ප්‍රාග්ධනිත කර ඇත.

ණය ප්‍රාග්ධනිත කිරීම

උප ව්‍යාපෘතීන් හි වැඩ කෙරීගෙන යන කාලය තුල නිකුත් කරන ලද ණය මුදල් වල පොළිය වැඩ අවසානයේ ණය මුදලට එකතු කොට මූලික මුදල සමග වාරික වශයෙන් ගෙවීමට කටයුතු යොදා ඇත. රඳවා ගැනීම් වලට පෙර අවසාන අතුරු ගෙවීම් දිනය එසේ පොළී ප්‍රාග්ධනිත කිරීම සඳහා ලුහු කාර්‍යය (cut off) දිනය වශයෙන් ගනු ලැබේ.

වගකීම්

ගෙවිය යුතු බිල් හා අනෙකුත් වගකීම් වල සියළුම මූල්‍ය වගකීම්, භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොළිය හා ගෙවිය යුතු ගාස්තු හා වියදම් ඇතුලත්ය.

පාරිතෝෂික

ස්ථිර සේවකයන්ගේ දළ වැටුපේ ප්‍රතිශතයක් වශයෙන් ඔවුන්ගේ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.

අර්ථ සාධක අරමුදල

දේශීය ණය සහ සංවර්ධන අරමුදල සේවක අර්ථසාධක අරමුදලට 12% ක් දායක වන අතර සේවකයන්ගේ දායකත්වය 8% ක් වේ.

භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදලට දේශීය ණය සහ සංවර්ධන අරමුදල 3% ක දායකත්වයක් සපයයි.

ආදායම් ප්‍රකාශන

පොලී ආදායම්

ලැබිය යුතු පොලී උපචිත පදනමට ගණනය කරනු ලැබේ. අක්‍රීය ණය වල පොලිය අවිනිශ්චිත පොලී ගිණුමක සමුච්චය කොට මුදල් පදනමට ආදායමට හඳුනාගනු ලැබේ.

පොලී හා වෙනත් වියදම්

ගෙවිය යුතු පොලී හා වෙනත් වියදම් උපචිත පදනමට හඳුනාගෙන ඇත.

ණය සහ ගිවිසුම්

2006.01.19 දින ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කල ණය අංක 2201 SRI (SF) ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුම් අනුව පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ B උපාංගය යටතේ ඇමරිකානු ඩොලර් 42.5 ක් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට වෙන්කොට ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන, වර්ගයට අනුව වෙනස් වන අනුපාතයකට ණය හා ආධාර ලබා ගනී.උප ණය ගිවිසුමේ 1.01 ඡේදයට අනුව හා ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කළ ණය ගිවිසුමේ 3.01 (a) ඡේදයට අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදලට දෙනු ලබන ණය ප්‍රමාණය විශේෂ හර ගැණුම් දෙසිය හතලිස් හය ලක්ෂ හැට හත් දහසක (SDR 24,667,000) කට සමාන මුදලකි, ණය ආපසු ගෙවීම, වසර 32 ක් තුල ත්‍රෛයි මාසිකව වාර 96 කින් වසර 08 ක සහන කාලයක් සහිතව හමාර කළ යුතුය.

පොලී ගෙවීම සහන කාලය තුල 1% ක් ද එයින් පසුව 1.5% ක් ද වේ. එය ත්‍රෛමාසික වාරය අවපාතයේ තිබූ ණය ශේෂය පදනම් කොටගෙන සිදුවේ.

පළාත් පාලන ආයතනයන්ට දෙන ලද ණය මුදල සඳහා 9% පොලියක් අයකරන අතර ආධාර ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් අරමුදල් වල පොලී ආන්තිකයෙන් ආවරණය කරගත යුතු වේ. ඒ නිසා අරමුදල් කළමනාකරණය දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අනාගතයට දැඩි බලපෑමක් ඇති කරයි.



....

එච්.ටී.කමල් පත්මසිරි
සභාපති
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
(ලේකම්- පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය)